**කොළඹ විශ්වවිද්‍යාලය , ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර - 2017/2018**

# ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතයි (07)

ඕනෑම ප්‍රශ්න <u>හතරකට</u> (04) <u>පමණක්</u> පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

01. ශ්‍රී ලංකාව විදේශීය නීතිවල බලපෑමට ලක්ව ඇති නමුදු, ශ්‍රී ලංකාවේ නීතිය තවමත් චාරිත්‍රානුකූල නීති හරහා එහි ස්වදේශීය සම්ප්‍රදාය ශක්තිමත් අයුරින් පවත්වා ගනියි. රටක බහුවිධ නීති පද්ධතියක පවතින වාසි සහ අවාසි ආශ්‍රිතව, ශ්‍රී ලංකාව පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

02. ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය, ශ්‍රී ලංකාවේ පුරාණ අධිකරණ පද්ධතියෙහි පැවති ලක්ෂණ පමණක් නොව, යටත් විජිත යුගයේ අධිකරණමය ව්‍යුහයන්ද පිළිබිඹු කරයි. කෙසේනමුත්, දැන් ඉතා පැහැදිලිව නිර්ණය කරන ලද අධිකරණ පාත්‍රතාවන් (Jurisdictions) සහිත විස්තීර්ණ අධිකරණ පද්ධතියක් රටේ ක්‍රියාත්මක වෙමින් පවතී.

    වර්තමාන මුල් අවස්ථා අධිකරණ සහ අභියාචනා අධිකරණ බලය සහිත අධිකරණ සතු විවිධ අධිකරණ බලයන් පිළිබඳව අවධානය යොමු කරමින්, ඉහත ප්‍රකාශය පිළිබඳව විමසන්න.

03. "ව්‍යවස්ථාපිත වෙනස් කිරීමට පමණක් යටත්ව, පුද්ගල නීතිය තුළ ප්‍රමුඛතම නීතිය ලෙසින් නැවත ඉස්මතුවනු පිණිස, පශ්චාත් නිදහස් කාලවකවානුව (The post-independence period) රෝම ලන්දේසි නීතිය වෙත නව ජීවයක් ලබාදී තිබේ."

(Prof. Savitri Goonesekere, The Roman Dutch Law in the Plural Legal System of Sri Lanka, The Colombo Law Review, Vol: 9, 1998, at p. 30)

ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ, රෝම ලන්දේසි නීතියේ භූමිකාව සම්බන්ධයෙන්යෙන් ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟවන්නේහිද? අදාල නඩු තීන්දු සහ ව්‍යවස්ථාපිත අධිකාරීන් ඇසුරින්, ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

04. "මේ සම්බන්ධයෙන් සලකා බැලීමට මතුවන ප්‍රශ්නය වන්නේ, රෝම ලන්දේසි දීලික්ත නීතියට සත්‍යවශයෙන්ම ආගන්තුක වන්නා වූ, අපවර්තනය පිළිබඳ තෝරතය (Tort of Conversion) අපගේ නීති පද්ධතියට ඇතුළත් කරගෙන තිබේද යන්නයි. එවැනි නීතියක් ලංකාවේ නීතිය තුලට හඳුන්වාදිය හැකි ක්‍රම දෙකක් පවතී - එනම් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයක් මඟින් හෝ එවැනි නීතියක් පිළිගන්නා ලද අවිච්ඡින්න නඩු තීන්දු මාලාවක් මගිනි.

අලස් විනිශ්චයකාරතුමා, <u>ලිලී ද කොස්තා</u> එ. <u>ලංකා බැංකුව</u> (1969) 72 න.නී. වා., පි. 493)

ඉහත ප්‍රකාශය ඇසුරින්, ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුලට, ව්‍යවස්ථාවන් හරහා ඉංග්‍රීසි නීතිය අන්තර්ගතකිරීම සිදුකරන ලද විවිධ ක්‍රම සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාල නඩු තීන්දු නීතිය සහ ව්‍යවස්ථාපිත අධිකාරීන් මඟින් තහවුරු කරන්න.

05. (අ) සහ (ආ) <u>කොටස් දෙකටම</u> පිළිතුරු සපයන්න.

(අ) ශ්‍රී ලංකාවේ මුස්ලිම් නීතිය යෙදී ඇති ආකාරය අනුව, දේශීය මුස්ලිම්වරුන්ට අනන්‍ය වූ පරිචයන් හා චාරිත්‍ර ඇතුළත් වන අතර, ඒවා ඉස්ලාමීය නීති විද්‍යාත්මක ක්‍රමයෙහි කොටසක් නොවන්නේය.

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟවන්නේහිද? ඔබගේ පිළිතුර, අදාල නඩු තීන්දු නීතිය සඳහන් කරමින් තහවුරු කරන්න.

(ආ) සුප්‍රසිද්ධ වෙළඳ ව්‍යාපාරිකයකු වන අසාත් 2011 වර්ෂයේදී, ෆාමියා විවාහ කරගත්තේය. 2015 වර්ෂයේදී, අසාත් සොෆියා සමග අනියම් සම්බන්ධතාවක් පටන්ගන්නා තුරු, ඔවුන්ගේ විවාහය ප්‍රීතිමත් එකක් විය. ෆාමියා අසාද්ගේ අනියම් සම්බන්ධතාවය පිළිබඳව දැනගත් අතර, ක්වාසි අධිකරණයේ (Quazi Court) දික්කසාදය ලබාගැනීම පිණිස ඇය අයදුම්පතක් ගොනු කළාය. කෙසේවෙතත්, අසාත් ක්‍රිස්තියානි ආගම වැළඳගෙන, සාමාන්‍ය විවාහ නීතිය යටතේ සොෆියා විවාහ කර ගත්තේය. ඉන්පසුව, අසාත් ක්වාසි අධිකරණයෙන් දික්කසාදය ලබා නොගෙන, දෙවන විවාහයක් සිදු කරගෙන ඇති බව දක්වමින් ෆාමියා පොලීසියෙහි පැමිණිල්ලක් ගොනු කළාය.

අසාත් පහත දක්වා ඇති කරුණු සම්බන්ධයෙන්, ඔබගේ උපදෙස් අපේක්ෂාවෙන් සිටී.

(i) ඔහුගේ දෙවන විවාහයේ වලංගු භාවය;

(ii) තම සැමියාගේ දෙවන විවාහය පිළිබඳව මුස්ලිම් භාර්යාවක් විසින් පොලිසියට කරන ලද පැමිණිල්ලෙහි ඇති නීත්‍යානුකූලභාවය;

අසාත්ට උපදෙස් දෙන්න.

06.පාරම්පරිකව යාපනයේ වාසය කරමින් සිටින ද්‍රවිඩ දෙමව්පියන්ට දාව සෙල්වරාජ් යාපනයේ දී උපත ලැබීය. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දී, සෙල්වරාජ්ට සඳනිව මුණගැසුණු අතර, ඔවුන් එකිනෙකා සමඟ ආදරයෙන් බැඳුණි. සඳනි උඩරට දෙමව්පියන්ට සිටි එකම දරුවාය. උපාධිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, සෙල්වරාජ්ට සහ සඳනිට කොළඹ ගුරුපත්වීම් ලැබුණි. වසර කිහිපයකට පසුව, ඔවුහු සාමාන්‍ය විවාහ ආඥා පනත යටතේ නුවරදී විවාහ වූහ. විවාහයෙන් පසුව යුවල දෙහිවල ප්‍රදේශයෙන් නිවසක් කුලියට ලබා ගත්හ. මේ කාලය අතරතුරදී, සෙල්වරාජ් සහ සඳනි යාපනයේ සිටින සෙල්වරාජ්ගේ දෙමාපියන් බැලීමට නිරන්තරයෙන් ගිය අතර, සෙල්වරාජ් තමාගේ සහෝදරයා සමගින් යාපනයේ දේපළ විකිණීමේ ව්‍යාපාරයක මුදල් ආයෝජනය කළේය. මෑතකදී, යාපනයේ පිහිටි රුපියල් මිලියන 10 ක කෘෂිකාර්මික ඉඩමක් හවුල් අයිතිකරුවන් ලෙස මිලදී ගැනීමට සෙල්වරාජ්ගේ සහෝදරයා ඔහුට යෝජනා කළේය. තමන් අන්තිම කැමති පත්‍රයක් රහිතව මියගියහොත්, තමන්ගේ බූදලය බෙදාහැරීම සම්බන්ධයෙන් තමන්ට යෙදෙන නීතිය කුමක්ද යන්න සහ තමන්ගේ බිරිඳ වන සඳනිට මේ සම්බන්ධයෙන් ඇතිවන බලපෑම කුමක්ද යන්න පිළිබඳව දැනගැනීමට සෙල්වරාජ් අදහස් කරයි.

සෙල්වරාජ්ට සහ සඳනිට උපදෙස් දෙන්න. ඔබගේ නෛතික උපදේශය අදාල ව්‍යවස්ථාපිත සහ නඩු තීන්දු අධිකාරීන් ඇසුරින් තහවුරු කළ යුතුය.

07. සීතා 1960 දී, උඩරට දෙමව්පියන්ට දාව උපත ලැබීය. නුවරදී ඇයගේ ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව, රැකියාවක් කිරීම සඳහා ඇය කොළඹට පැමිණියාය. ඇය කොළඹ පිහිටි සමාගමක රැකියාවක් කරමින් සිටින අතරතුරදී ඇයට සරත්ව මුණගැසිණි. සරත්ගේ දෙමාපියන් පේරාදෙණියේ වාසය කරන ලද අතර, ඔහු උඩරැටියකු හා උඩරැටියකු නොවන තැනැත්තෙකු අතර සිදු වූ විවාහයක දරුවෙකි. ඔහුගේ පියාගේ මුල් පදිංචිය ගාල්ල ප්‍රදේශයේ වූ අතර

1948 දී, ඔහු සරත්ගේ මව සමඟ භින්න විවාහයකට එළඹ තිබුණි. සරත්ගේ මව ඉතා ධනවත් උඩරට පවුලක එකම දියණිය වූවාය. සරත් හා සීතා 1985 දී උඩරට නීතිය යටතේ, විවාහ වූවෝය.

මෑතක දී නීති ශිෂ්‍යයකු වන අමල් විසින් සරත්ට පවසා ඇත්තේ, සරත්ගේ විවාහය නීත්‍යානුකූල නොවන බවයි. අමල්ගේ තර්කය වන්නේ, සරත් උඩරටියෙකු නොවන බවත් එමනිසා සරත්ට සහ සීතාට ඔවුන්ගේ විවාහය උඩරට නීතිය යටතේ ලියාපදිංචි කිරීමට හා විධිමත් කිරීමට නොහැකි බවත්ය.

ඉහත දක්වා ඇති සිද්ධිමය සාධක සැලකිල්ලට ගනිමින්, ඔවුන්ගේ විවාහයේ පවතින නීත්‍යානුකූලභාවය පිළිබඳව සීතාට සහ සරත්ට උපදෙස් දෙන්න.

ඔබගේ පිළිතුර, ව්‍යවස්ථාපිත සහ නඩු තීන්දු අධිකාරීන් මඟින් තහවුරු කළ යුතුය.

********************